දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

මගේ අංකය ) DDG(EOHFS)/13-9/2017
எனது இல )
My No.

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය ) 09 .05.2020
திகதி )
Date )

සුවසිරිපාය
சுவசிரிபாய
**SUWASIRIPAYA**

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
சுகாதார மற்றும் சுதேச வைத்திய சேவைகள் அமைச்சு
**Ministry of Health & Indigenous Medical Services**


චක්‍රලේඛ අංකය: . 02-27/2020

සියලුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්

සියලුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්

අධ්‍යක්ෂ , ජාතික සෞඛ්‍ය විද්‍යා ආයතනය

සියලුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්

**සේවා ස්ථාන වල කොවිඩ්- 19 ව්‍යාප්තිය වැළැක්වීමට පෙර සූදානම සහ ප්‍රතිචාර දැක්වීම සඳහා වන මෙහෙයුම් මාර්ගෝපදේශය**

<u>බාබර් සැලූන් සහ රූපලාවන්‍යාගාර</u>

කොවිඩ් -19 ව්‍යාප්තියේ අවධානම පවතින සමයේදී සේවා සැපයීම සඳහා විවෘත කරන බාබර් සැලූන් සහ රූපලාවන්‍යාගාර පවත්වාගෙන යාමට අනුගමනය කල යුතු ක්‍රියාපිළිවෙත් මෙම මාර්ගෝපදේශය මගින් විස්තර කෙරෙයි.

මෙම මාර්ගෝපදේශය **2020 අප්‍රේල් 27** දින සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් නිකුත් කරන ලද **'සේවා ස්ථාන වල කොවිඩ්- 19 ව්‍යාප්තිය වැළැක්වීමට පෙර සූදානම සහ කල යුතුය** මෙම මාර්ගෝපදේශයේ අරමුණ කොවිඩ්-19 ව්‍යාප්තියේ අවධානම පවතින සමයේදී මහජනතාවට අවශ්‍ය සේවාවක් ලෙස සලකමින් බාබර් සැලූන් සහ රූපලාවන්‍යාගාර සීමිත සේවාවන් සංඛ්‍යාවක් ලබා දීම සඳහා ආරම්භ කිරීමය .මෙම ප්‍රධාන මාර්ගෝපදේශය සෞඛ්‍ය අමාත්‍යංශයේ <u>health.gov.lk</u> යන වෙබ් අඩවියෙන් බාගත හැක.

**1. පොදු ක්‍රියාමාර්ග**

1.1. මෙම මාර්ගෝපදේශයේ අරමුණ කොවිඩ්-19 ව්‍යාප්තියේ අවධානම පවතින සමයේදී මහජනතාවට අවශ්‍ය සේවාවක් ලෙස සලකමින් බාබර් සැලූන් සහ රූපලාවන්‍යාගාර සීමිත සේවාවන් සංඛ්‍යාවක් ලබා දීම සඳහා ආරම්භ කිරීමය.

1.2. පහත සඳහන් සේවාවන් පමණක් බාබර් සැලුන් සහ රූපලාවන්‍යාගාර තුල ලබා දිය යුතුය.

1.2.1. කොණ්ඩා කැපීම

1.2.2. කොණ්ඩය ඩයි කිරීම

1.2.3. අත් හා පා වල නියපොතු සඳහා වන සාත්තුව

1.2.4. අත් හා පා වල පමණක් රෝම ඉවත්කිරීම

1.3. මෙම සේවා ස්ථාන වල සේවාලාභියා සහ සේවා සපයන්නා අතර, රෝග ව්‍යාප්තිය පාලනය සඳහා ඇති මූලික ක්‍රියාමාර්ගයක් වන භෞතික දුරස්ථභාවය රැකගැනීමට නොහැක. එබැවින් එසේ විවෘත කරන සේවා ස්ථාන පිළිපැදිය යුතු සහ අනුගමනය කල යුතු උපදෙස් මාලාවක් මෙහි විස්තර කර ඇති අතර සියලුම බාබර් සැලුන් සහ රූපලාවන්‍යාගාර මෙහි සඳහන් සියලුම උපදෙස් තරයේ පිළිපැදිය යුතුය.

1.4. මෙම මාර්ගෝපදේශය අනුව විවෘත කිරීමට අවසර ලැබෙන සේවා ස්ථාන වල සපයන සේවාව 1.2 යටතේ දක්වා ඇති සේවාවන්ට සීමා කල යුතු අතර වෙනත් කිසිම සේවාවක් ලබා නොදිය යුතුය. එවැනි සේවාවන් සේවාදායකයා සහ සේවාලාභියා යන දෙදෙනාටම කොවිඩ්-19 වැළඳීමේ අවදානම වැඩි කරන බැවින් ඊට අවසර නොලැබේ.

1.5. සෞඛ්‍ය බලධාරීන් සහ පොලිසිය මගින් මෙම සේවා ස්ථාන වල සේවාවන් නියාමනය කරන අතර මෙම මාර්ගෝපදේශයේ සඳහන් උපදෙස් උල්ලංඝණය කරන සේවා ස්ථාන වලට එරෙහිව නිසි ක්‍රියාමාර්ග ගනු ලැබෙයි.

## 2. බාබර් සැලුන් සහ රූපලාවන්‍යාගාර නැවත විවෘත කිරීම සඳහා අනුගමනය කලයුතු ක්‍රියා පටිපාටිය

2.1. විවෘත කිරීමට බලාපොරොත්තු වන බාබර් සැලුන් හෝ රූපලාවන්‍යාගාර වල අයිතිකරු/ කළමනාකරු, එය පිහිටි ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත ඉල්ලීම් ලිපියක් ලබා දිය යුතුය.

2.2. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් අයදුම් පත සමග ඇමුණුම 01 හි සඳහන් පිරික්සුම් පත්‍රිකාව අයිතිකරුට / කළමනාකරුට නිකුත් කර මෙම මාර්ගෝපදේශයට අනුගත වන ලෙස දන්වා සිටිය යුතුය.

2.3. අයිතිකරු / කළමනාකරු අයදුම්පත සම්පූර්ණ කල යුතු අතර ඇමුණුම 01 හි ඇති පිරික්සුම් පත්‍රිකාවේ නියම කර ඇති කරුණු ආයතනයේ ඇති පහසුකම් සමඟ සසඳා නිවැරදි ප්‍රතිචාරය දෙවන තීරුවේ ලකුණු කර සම්පූර්ණ කල යුතුය. එසේ සම්පූර්ණ කල පත්‍රිකාව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත භාර දිය යුතුය.

2.4. විකල්පයක් ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශ වෙබ් අඩවියෙන් (health.gov.lk) බාගත කරගත් සම්පූර්ණ කරන ලද මෙම අයදුම් පත වුවද සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත ලබා දිය හැකිය.

2.5. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් අදාල ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක වෙත එම සේවා ස්ථානය පරීක්ෂා කර පිරික්සුම් පත්‍රිකාව සමඟ සසඳා බලා නිර්දේශ ලබා දීමට උපදෙස් දිය යුතුය.

2.6. සේවා ස්ථානයේ පෙර සූදානම සතුටුදායකනම්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් කාර්යාලයේ ඇති තාවකාලික ලේඛනයේ එම සේවා ස්ථානය ලියාපදිංචි කර සේවාවන් ආරම්භ කිරීමට අවශ්‍ය සහතිකය නිකුත් කල යුතුය. මෙම සහතිකයේ ආකෘතිය මෙම මාර්ගෝපදේශයේ ඇමුණුම 02 හි ලබා දී ඇත.

2.7. අදාළ ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් නිකුත් කල වලංගු සේවා ආරම්භක සහතිකයක් නොමැතිව කිසිම බාබර් සැලූනයක් හෝ රූපලාවන්‍යාගාර ආයතනයක් සේවය ආරම්භ නො කල යුතුය.

3. සේවා ස්ථානයේ සැකසුම

3.1. විශාල ආයතනවලට මානව සම්පත් සැලැස්මක් ඇතුළුව ලිඛිත කොවිඩ්-19 පෙර සූදානම් වීමේ සහ ප්‍රතිචාර දැක්වීමේ සැලැස්මක් තිබිය යුතු අතර සහ එම සැලැස්ම නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම සහතික කිරීම සඳහා ඒ සඳහාම වෙන්වූ සුදුසු සේවක මහතෙකු/ මහත්මියෙකු යෙදවිය යුතුය.

3.2. සේවය සඳහා කැඳවනු ලබන්නේ ස්ථිර හෝ පුද්ගලික විස්තර සපයාගත හැකි කාර්ය මණ්ඩලය පමණක් බවට අයිතිකරු / කළමනාකරණය වග බලා ගත යුතුය. සේවක සේවිකාවන්ගේ ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංක, දුරකථන අංක සහ සමීපතම ඥාතීන්ගේ තොරතුරු ඇතුලත් ලේඛනයක් අයිතිකරු / කළමනාකරු විසින් පවත්වාගෙන යා යුතු අතර එම ලේඛනයේ පිටපතක් ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක/සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි වෙත ලබා දිය යුතුය.

3.3. පහත සඳහන් කාණ්ඩවල සේවකයින් සේවය සඳහා වාර්තා නොකල යුතුය

- උණ, කැස්ස, නාසයෙන් සොටු දියර ගැලීම, උගුරේ අසාදනය සහ හුස්ම ගැනීමේ අපහසුතාව ආදී තීව්‍ර (කෙටි කාලීනව ඇති වූ) ශ්වසන රෝග ලක්ෂණ ඇති පුද්ගලයින්
- පසුගිය දින 14 තුල නව කොරෝනා අසාදනය පිළිබඳ සැක සහිත හෝ තහවුරු කල පුද්ගලයෙක් සමඟ සම්බන්ධතා පැවැත්වූ පුද්ගලයින්
- නව කොරෝනා අසාදනයට ඇති අවදානම හේතුවෙන් නිරෝධායනය වෙමින් පවතින පුද්ගලයින්

3.4. අසනීප පුද්ගලයෙකු සේවය සඳහා වාර්තා කලහොත් ඔහු / ඇය වහාම ආපසු ගෙදර යැවීමට අයිතිකරු/කළමනාකරු වගබලා ගත යුතුය.

3.5. සේවා පරිශ්‍රයට ඇතුළු වන සෑම අයෙක්ම (අමුත්තන් සහ සේවකයන්) ඇතුළු වීමට පෙර සබන් යොදා අත් සේදිය යුතුය. (පාදයෙන් ක්‍රියාත්මක කල හැකි වතුර කරාමයක් මේ සඳහා වඩාත් සුදුසු වේ). විකල්පයක් ලෙස මද්‍යසාර අඩංගු (මද්‍යසාර 70% v/v ) දෑත් පිරිසුදු කාරක භාවිතා කල හැකිය. විෂබීජහරණය කුටීර භාවිතා කිරීම නිර්දේශ නොකරයි. ඇඟිලි සලකුණු යන්ත්‍රය ඇතිවිට එය භාවිතා කිරීමෙන් පසු දෑත් සඳහා පිරිසුදු කාරක (අවම 70% v/v මධ්‍යසාර) භාවිතා කල යුතු අතර. සෑම සේවා මුරයකටම පෙර සහ පසු ඇඟිලි සලකුණු යන්ත්‍රය විෂබීජහරණය කල යුතුය. මීට අමතරව ඇතුල්වන ස්ථානයේදී පාවහන් ඉවත් කර පරිශ්‍රය තුළ භාවිතා කිරීමට නව පාවහන් යුගලක් ලබා දීම සිදු කල හැකිය.

3.6. සේවා පරිශ්‍රයට ඇතුළු වන අවස්ථාවේදී සියලු සේවකයින්ගේ ශරීර උෂ්ණත්වය පරීක්ෂා කිරීම සිදුකල යුතු අතර 98.4 $^0$F හෝ 37 $^0$C ට වඩා වැඩි උෂ්ණත්වයක් වාර්තා වූ විට එම සේවකයා මිනිත්තු 10 ක් 15 ත් අතර කාලයක් විවේක ගැන්වීමෙන් පසු නැවත පරික්ෂා කල යුතුය. නැවතත් ශරීර උෂ්ණත්වය වැඩි නම් ඔහු/ඇය ආපසු හරවා යැවිය යුතුය. මෙහි භාවිතා කරන උෂ්ණත්වමානය වෛද්‍ය උෂ්ණත්ව මානයක් විය යුතුයි.

## 4. විශේෂිත පියවර

4.1. සේවාලාභීන් හට සේවා සැපයීමේ දී, සේවා සපයන්නා ශල්‍ය මුඛ ආවරණයක් සහ ආරක්ෂක කන්නාඩි/මුහුණු ආවරණ මුළු කාලය පුරාම පැළඳිය යුතුය.

4.2. පාවිච්චි කරන ලද මුඛ ආවරණ සහ ටිෂූ කඩදාසි ඉවතලීම සඳහා පාදයෙන් විවෘත කල හැකි කසල බඳුනක් සැපයිය යුතුය.

4.3. කොණ්ඩය කැපීමේදී හැර සෙසු සියලු දෙනා (සේවා සපයන්නන් සහ සේවාලාභීන්) එකිනෙකා අතර අවම වශයෙන් මීටරයක වත් දුරින් සිටිය යුතුය. මීටරයක දුරක් පවත්වා ගැනීම සඳහා ආයතනයට වරකදී ඇතුළු වන සේවාලාභීන් සංඛ්‍යාව සීමා කල යුතුය. සේවාලාභීන් හට කොණ්ඩය කැපීමේ වේලාවන් වෙන්කරවා ගත හැකි ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම නිර්දේශ කරනු ලැබේ.

4.4. භෞතික දුරස්ථභාවය සහතික කිරීම සඳහා ගෘහ භාණ්ඩ නැවත සකස් කළ යුතුය.

4.5. බාබර් සැලූනයේ හෝ රූපලාවන්‍යාගාරයේ රැඳී සිටින සේවාලාභීන් සංඛ්‍යාව සීමා කරන්න. සේවාලාභීන් තම වාරය පැමිණෙන තුරු ආයතනය පිටත හෝ තම වාහනවල රැඳී සිටීම නිර්දේශ කරනු ලැබේ.

4.6. සේවාලාභීන් සහ කාර්ය මණ්ඩලය අතර භෞතික ගනුදෙනු සීමා කරන්න.

4.7. සඟරා, පුවත්පත්, සේවා මෙනු, රූපවාහිනී දුරස්ථපාලක, අනවශ්‍ය කඩදාසි නිෂ්පාදන සහ අලංකරණයන් වැනි සියලුම අනවශ්‍ය දෑ ඉවත් කරන්න.

4.8. සෑම සේවා සපයන්නෙකු විසින්ම සේවාලාභියෙකුට සේවය සැපයීමට පෙර සහ පසු සබන් යොදා දෑත් හොඳින් සේදිය යුතුය.

4.9. සේවා සපයන්නන් සෑම විටම සේවාලාභියාට පිටුපසින් සහ පැතිවලින් පමණක් සිටගෙන සේවා සැපයිය යුතු අතර කිසි විටෙකත් මුහුණට මුහුණ ලා නොසිටිය යුතුය.

4.10. සේවා සපයන්නන් අතර උපකරණ සහ මෙවලම් බෙදා ගැනීමෙන් වැළකිය යුතුය.

4.11. සේවා සපයන්නා සහ සේවාලාභියා අතර ඇසුරු කරන කාලය අවම වීම සඳහා සේවාව අවම කාලයක් තුල ලබාදිය යුතුය.

4.12. භාවිතා කරන සියලුම රෙදිපිළි (ඇතිරිලි සහ තුවා ) එක් වරක් භාවිතයෙන් පසු සේදිය යුතු අතර සේදීමකින් තොරව වෙනත් සේවාලාභියකු සඳහා කිසි විටෙකත් භාවිතා නොකල යුතුය. බාබර් සැලූන් සහ රූපලාවන්‍යාගාර වල අවම වශයෙන් දින 2 ක් සඳහා ප්‍රමාණවත් රෙදිපිළි ප්‍රමාණයක් තිබිය යුතුය.

4.13. රැවුල හා උඩු රැවුල කැපීම නිර්දේශ නොකරයි.

4.14. බෙල්ල පිටුපස වැනි ස්ථාන සඳහා භාවිතා කල රේසර් බ්ලේඩ් භාවිතයෙන් පසු වහාම ආරක්ෂාකාරීව ඉවත ලිය යුතු අතර කිසි විටෙකත් නැවත භාවිතා නොකල යුතුය.

4.15. සේවා සපයන්නන් කිසි විටෙකත් සේවාලාභියාගේ තොල් ස්පර්ශ නොකල යුතුය

4.16. වාතය නැවත සංසරණය වන වායු සමීකරණ නිර්දේශ නොකරයි.

4.17. පෘෂ්ඨ ස්පර්ශවීම් අවම කිරීම සඳහා හැකි තරම් දොරවල් විවෘතව තබන්න. වැසූ දොරවල් වල දොර අගුලු/හැඩලයන් සෑම පැය තුනකට වරක් පිරිසිදු කර විෂබීජහරණය කල යුතුය. විකල්පයක් ලෙස සේවාලාභීන් සඳහා දොර විවෘත කිරීමට වෙනම සේවකයෙක්/ සේවිකාවක් යෙදවිය හැකිය.

4.18. බාබර් සැලුන් සහ රූපලාවන්‍යාගාර තුලදී ලබා දෙනු ලබන සේවාවන් හා ගනු ලබන සියලුම විශේෂ ක්‍රියාමාර්ග සේවාලාභීන් හට කියවා දැනගැනීම සඳහා පැහැදිලිව ආයතනය ඇතුළත හා පිටත ප්‍රදර්ශනය කල යුතු අතර සේවාලාභීන් හට එම උපදෙස් වාචිකව පැහැදිලි කල යුතුය.

4.19. සියළු පාර්ශව ඉහත ක්‍රියාමාර්ග නිවැරදිව අනුගමනය කරන බවට දැඩි අධීක්ෂණයක් හා නියාමනයක් සිදු කරන බවට වග වියයුතුය.

## 5. මතුපිට පිරිසිදු කිරීම හා විෂබීජහරණය කිරීම

5.1. දිනපතා වැඩ ආරම්භ කිරීමට පෙර, සුපුරුදු පිරිසිදු කිරීමේ කටයුතු වලට අමතරව, සියලු ගෘහ භාණ්ඩ, උපකරණ සහ පොළොව ඇතුළුව වෙළඳසැල විෂබීජහරණය කල යුතුය. දවසේ සේවා කටයුතු ආරම්භ කිරීමට පෙර පිළිගැනීමේ කවුන්ටරය, ගනුදෙනුකරුවන් රැඳීසිටින ස්ථානවල ඇති පුටු ඇතුළු සියලුම ගෘහ භාණ්ඩ මතුපිට පෘෂ්ඨ විෂබීජහරණය කරන්න( ප්‍රධාන මාර්ගෝපදේශයේ 3.3 පරිච්ඡේදයේ විෂබීජහරණය කොටස වෙත යොමු වන්න).

5.2. ප්‍රධාන මාර්ගෝපදේශයේ 3.3 වගන්තියට අනුව එක් සේවාලාභියෙකු සඳහා භාවිතා කල පසු වෙනත් සේවාලාභියෙකු සඳහා භාවිතා කිරීමට පෙර, සේවා සපයන පුටුව, මේසය මතුපිට, පනාව සහ හිසකෙස් සකසන බුරුසු ඇතුළු සියලු උපකරණ සහ මෙවලම් විෂබීජහරණය කරන්න.

## 6. අපද්‍රව්‍ය බැහැර කිරීම

සෑම සේවාලාභියෙකුටම සේවය කිරීමෙන් පසුවම කපන ලද හිසකෙස්, නියපොතු ආදිය වෙනම අපද්‍රව්‍ය එකතු කිරීමේ බෑගයකට එකතු කල යුතුය. බෑගය පිරුණු පසු එය නිසි ලෙස ගැට ගසා ආරක්ෂිතව ගබඩා කල යුතු අතර බැහැර කල යුත්තේ සතියකට පසුවය. මුඛ ආවරණ, ටිෂූ කඩදාසි සහ පිසදැමීමේ කඩදාසි වැනි එක් වරක් භාවිතා කර ඉවත දැමිය යුතු පුද්ගලික සනීපාරක්ෂක ද්‍රව්‍ය සඳහා වෙනත් අපද්‍රව්‍ය බහාලන බෑගයක් තිබිය යුතුය. මෙම බෑගය ද ඉහත සඳහන් කළ පරිදි බැහැර කල යුතුය.

**වැඩි විස්තර සඳහා, සෞඛ්‍ය අමාත්‍යාංශයේ පාරිසරික ,වෘත්තීය සෞඛ්‍ය සහ ආහාර සුරක්ෂිතතා අංශය විසින් 2020 අප්‍රේල් මස 27 වන දින මාර්ගෝපදේශයක් ලෙස නිකුත් කල "සේවා ස්ථාන වල කොවිඩ් 19 ව්‍යාප්තිය වැළැක්වීමට පෙර සූදානම සහ ප්‍රතිචාර දැක්වීම සඳහා වන මාර්ගෝපදේශය"** බලන්න.

**විමසීම් සඳහා සෞඛ්‍ය හා දේශීය සෞඛ්‍ය අමාත්‍යාංශයේ පාරිසරික හා වෘත්තීය සෞඛ්‍ය හා ආහාර සුරක්ෂිතතා** අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය ලක්ෂ්මන් ගම්ලත් මහතා අමතන්න, 071-7723232, ltgamlath@gmail.com.

**විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ**
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පිටපත්: 1. ගරු. පවිත්‍රා වන්නිආරච්චි, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යතුමිය
2. ලේකම්, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
3. අතිරේක ලේකම් මහජන සෞඛ්‍ය සේවා),සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
4. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, මහජන සෞඛ්‍ය සේවා I

## ඇමුණුම 01

**සේවා ස්ථාන වල කොවිඩ් 19 ව්‍යාප්තිය වැළක්වීමට පෙර සූදානම සහ ප්‍රතිචාර දැක්වීම සඳහා වන මාර්ගෝපදේශය යටතේ බාබර් සැලූන් හෝ රූපලාවන්‍යාගාර විවෘත කිරීම සඳහා වන අයදුම්පත සහ පිරික්සුම් ලැයිස්තුව**

ආයතනයේ නම: ....................................................ව්‍යාපාර ලියාපදිංචි අංකය............

ලිපිනය: .............................................................................

අයිතිකරුගේ / කළමනාකරුගේ නම: ...............................................

දූරකථන (ජංගම): ............................ දූරකථන (ස්ථාවර) : ............................ ..

සේවා සපයන කරණවැමියන් /ශිල්පිනියන් ගණන: ..........මුළු සේවකයින් සංඛ්‍යාව:.........

| | සපුරාලිය යුතු අවශ්‍යතා | අයිතිකරුගේ පිරික්සුම | ම.සෞ.ප. ගේ නිරීක්ෂණය | සටහන් |
|---|---|---|---|---|
| 01 | ජල පහසුකම් සපයා ඇත | ඔව්/නැහැ | ඔව්/නැහැ | |
| 02 | සේවා ස්ථානය ඉඩකඩ සහිත වන අතර ප්‍රමාණවත් ලෙස වාතාශ්‍රය ඇත | ඔව්/නැහැ | ඔව්/නැහැ | |
| 03 | සේවා සපයන පුටු අතර මීටර් 1 ක දුරක් පවතින පරිදි ඇතුලත ගෘහ භාණ්ඩ සකසා ඇත | ඔව්/නැහැ | ඔව්/නැහැ | |
| 04 | ගනුදෙනුකරුවන් අතර මීටර 1 ක දුරක් පවත්වා ගැනීමට හැකිවන පරිදි ඇතුලත ගෘහ භාණ්ඩ සකසා ඇත | ඔව්/නැහැ | ඔව්/නැහැ | |
| 05 | අත් සේදීමේ පහසුකම් / දෑත් පිරිසිදුකාරක පිවිසුම් ස්ථානයේ සහ ආයතනය තුල සපයා ඇත | ඔව්/නැහැ | ඔව්/නැහැ | |
| 06 | සේවකයන්ගේ නම් සහ විස්තර ලැයිස්තුවක් ඇත | ඔව්/නැහැ | ඔව්/නැහැ | |
| 07 | පවතින රෙදිපිළි(Towel & capes) ප්‍රමාණය අවම වශයෙන් දින 2 ක සේවා කටයුතු සඳහා ප්‍රමාණවත්වේ | ඔව්/නැහැ | ඔව්/නැහැ | |
| 08 | මුඛ ආවරණ සහ ටිෂූ කඩදාසි ආදිය බැහැර කිරීම සඳහා පාදයෙන් විවෘත කල හැකි කසල බඳුන් ඇත | ඔව්/නැහැ | ඔව්/නැහැ | |
| 09 | උපකරණ කට්ටල සේවකයන් අතර හුවමාරු කිරීම වැළක්වීම සඳහා ප්‍රමාණවත් ලෙස සපයා ඇත | ඔව්/නැහැ | ඔව්/නැහැ | |

| | | | | |
|---|---|---|---|---|
| 10 | අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ඇති බැග් සංඛ්‍යාව ප්‍රමාණවත්ය | ඔව්/නැහැ | ඔව්/නැහැ | |
| 11 | විෂබීජහරණය සඳහා අවශ්‍ය ද්‍රාවණ ඇත | ඔව්/නැහැ | ඔව්/නැහැ | |
| 12 | ආයතනය පිටත හා ඇතුළත උපදෙස් හා ලබාදෙන සේවා පිලිබඳ විස්තර ප්‍රදර්ශනය කර ඇත | ඔව්/නැහැ | ඔව්/නැහැ | |

ඉහත දක්වා ඇති තොරතුරු නිවැරදි බව මා සහතික කරන අතර ඉහත දක්වා ඇති අවශ්‍යතා සපුරාලීමට මා අපොහොසත් වුවහොත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිට මාගේ බාබර් සැලුනය /රූපලාවන්‍යාගාරය වසා දැමිය හැකි බව මම දනිමි. එමෙන්ම මෙහි අංක 2.1 සඳහන් සේවා පමණක් පවත්වාගෙන යන බවත් වෙනත් සේවාවක් ලබා නොදෙන බවත් මම ප්‍රකාශ කරමි.

.................................................................. ..................................................................

අයිතිකරුගේ /කළමනාකරුගේ නම අත්සන

.............................................. ........................................

ජාතික හැඳුනුම්පත් අංකය දිනය

**බාබර් සැලුන්/රූපලාවන්‍යාගාරය විවෘත කිරීම නිර්දේශ කරමි / නිර්දේශ නොකරමි**

........................................... ....................

ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක අත්සන දිනය

**ඉදිරිපත් කරමි**

........................................... .................

පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක අත්සන දිනය

**බාබර් සැලුන් /රූපලාවන්‍යාගාරය විවෘත කිරීම අනුමත කරමි**

........................................ .........

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී අත්සන දිනය

## ඇමුණුම 02

### <u>බාබර් සැලූන් හෝ රූපලාවන්‍යාගාර ආරම්භ කිරීම සඳහා සහතිකය</u>

ආයතනයේ නම:........................................................ලියාපදිංචි අංකය..................

ලිපිනය: ......................................................................................................................

අයිතිකරුගේ / කළමනාකරුගේ නම: ...................................................................................

ඉහත සඳහන් ආයතනය සම්බන්ධයෙන් ................................... දින යොමු කල ඔබගේ අයදුම්පත සලකා බැලීමෙන් අනතුරුව ......................................... දින සිට සේවා ආරම්භ කිරීමට අනුමැතිය දෙමි. ඒ අනුව පහත සඳහන් සේවා පමණක් සැපයිය හැකි වන අතර වෙනත් සේවාවක් සැපයිය නොහැක.

- හිසකෙස් කැපීම / හිසකෙස් කෙටි කිරීම
- හිසකෙස් වර්ණ ගැන්වීම
- කකුලේ හා අතෙහි නියපොතු සාත්තුව
- කකුලේ සහ අත්වල රෝම ඉවත්කිරීම

කෙසේ වෙතත්, මාර්ගෝපදේශයේ දක්වා ඇති නියමිත අවශ්‍යතා සපුරා ගැනීමට ඔබ අපොහොසත් වුවහොත් අනතුරු ඇඟවීමකින් තොරව මෙම සහතිකය අවලංගු කරනු ලැබේ.

.................................... ............................. ..

අත්සන සහ නිල මුද්‍රාව දිනය

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී